බස්නාහිර පළාතේ පළාත් සභාව
மேல் மாகாண மாகாண சபை
WESTERN PROVINCE PROVINCIAL COUNCIL

බස්නාහිර පළාතේ පළාත් සභාවේ සියළුම ගරු මන්ත්‍රීවරුන් වෙත,

**<u>සභා රැස්වීම</u>**

2013 ඔක්තෝබර් මස 22 වන දින කල් තැබීම අනුව, බස්නාහිර පළාතේ පළාත් සභාව 2013 නොවැම්බර් මස 05 වන දින පෙ.ව 09.30 ට බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රයේ සභා ශාලාවේදී රැස්වෙන බව කාරුණිකව දැනුම් දෙමි.

න්‍යාය පත්‍රය මේ සමඟ ඇත.

සුනිල් විජේරත්න,
සභාපති,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.10.22 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

## බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2013 නොවැම්බර් මස 05 වන දින පෙ.ව. 9.30 ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

01. ගරු සිරිකමල් පිලිෂියන්ද සිල්වා මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සමාජ සුභසාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමාරක්ෂක සේවා සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට : (ප්‍ර/V (1)13/15)

අ. පමුණුගම රෝහලේ මාතෘ නිවාසය නිසි පරිදි ක්‍රියාත්මක නොවන බව ඔබතුමා දන්නවාද ?

ආ. එම රෝහලේ රසායනාගාරය අක්‍රියව පවතින බව ඔබතුමා දන්නවාද ?

ඇ. එම රෝහලේ බාහිර රෝගී අංශය නිසි පරිදි ක්‍රියාත්මක නොවන බව ඔබතුමා දන්නවාද ?

ඈ. රෝහල් කාර්ය මණ්ඩලය අතර ඇති අසමගිභාවය නිසා රෝගීන් සහ පරිපාලනය අපහසුතාවයට ලක් වී ඇති බව ඔබතුමා දන්නවාද ?

ඉ. මෙම තත්වය පිළිබඳව ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ගය කුමක්ද ?

VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. සභාවේ රැස්වීම් I

### ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට

යෝජනාව :

"2013-10-22 දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී එළඹුණු එකඟතාවයට අනුව අද දින විසිර යැමෙන් අනතුරුව මෙම සභාව 2013 නොවැම්බර් මස 26 වන දින පෙ. ව. 9.30ට රැස්විය යුතු අතර, 2013 නොවැම්බර් මස 19 වන දිනය (අඟහරුවාදා) සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් ලෙස සැලකිය යුතුය."

## සභාවේ රැස්වීම් II

### ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට

යෝජනාව :

"*2014 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ සම්බන්ධ වැඩ කටයුතු*" සඳහා වෙන් කළ දිනයන් සම්බන්ධයෙන් මින් පෙර කිනම් තීරණයක් ගෙන තිබුනද, ඒ කිසිත් නොතකා, 2013-10-22 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ දී එළඹුණු එකඟතාවය ද සැලකිල්ලට ගෙන, 2013 දෙසැම්බර් මස 03, 04, 05 හා 06 යන දිනයන්, "*2014 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ හා සම්බන්ධ වැඩ කටයුතු*" සඳහා වෙන්කළ දිනයන් විය යුතු යැයි සළකා ක්‍රියා කළ යුතුය."

## X. සභාවේ කටයුතු I

### ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට

යෝජනාව :

"මින් පෙර කිනම් තීරණයකට එළඹුණද, ඒ කිසිත් නොතකා "*2014 වර්ෂයේ මුදල් ප්‍රකාශය පළාත් සභාවට ඉදිරිපත් කිරීම*" 2013-11-26 දින සිදුකළ යුතුය"

## සභාවේ කටයුතු II

### ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට

යෝජනාව :

"අද දින න්‍යාය පත්‍රයේ "*අංක XI පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු*" යටතේ වූ වැඩකටයුතු වල කාර්ය අනුපිළිවෙළ පිළිවෙලින් විෂයය අංක 03, 01 හා 02 වන පරිදි විය යුතු යැයි සළකා ක්‍රියා කළ යුතුය"

# XI. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

## 01. ගරු සිරිකමල් ෆිලිෂියන් ද සිල්වා මන්ත්‍රීතුමා :

"ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂිකව සිදුවන අධික පාඩුව අවම කර ගැනීම සඳහා යැයි පවසමින් පසු ගිය අප්‍රේල් මස විදුලි බිල වැඩි කරමින් එම පාඩුවට මුදල් මහජනතාවගෙන් අය කර ගැනිමට කටයුතු කරන ලදී. වර්ෂාව නොලැබීම නිසා ජලාශ හිඳීයාම හේතුවෙන් රටේ විදුලිබල අවශ්‍යතාවයෙන් සියයට 18 ක(18%) ප්‍රමාණයක් ජල විදුලිය මගින් විදුලිය නිපදවීමට සිදුවූ බවත්, පෞද්ගලික විදුලි බලාගාර මගින් වැඩි මිලට විදුලිය මිලදී ගැනීමට හා වෙනත් ක්‍රම මගින් විදුලිය නිපදවීමට ද සිදුවූ බවත් ප්‍රකාශ විය. දැනට මාස කීපයක සිට ඇද හැලෙන ධෞරානිපාත වර්ෂාව හේතුවෙන් ජලාශ පිරී ඉතිරී ගොස් සියයට 85 ක (85%) විදුලිය නිපදවීම ජලවිදුලි බලාගාර මගින් සිදු වේ. එමනිසා වැඩි කරන ලද විදුලි බිල වහාම අඩු කර මහජනතාව වෙත සහන සලසන මෙන් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජය වෙත යෝජනා කර සිටියි"

(යෝ/v (01)13/05 )

## 02. ගරු අශෝකා ලංකාතිලක මන්ත්‍රීතුමිය :

"වසර 30 ක් තිස්සේ කුරිරු යුද්ධයකින් බැටකමින්, අනාගතය ගැන සිතන්නටවත් නොහැකිව සිටි ශ්‍රී ලාංකික අපට අද මේ රට තුල කෙරෙන සංවර්ධන ක්‍රියාදාමයන් පිළිබඳව අතිශයින් සතුටු විය හැක. එනයින් බලන කල අපගේ අනාගත පරම්පරාව අපට වඩා වාසනාවන්තයන් යැයි හැඟෙන අතර, එම සංවර්ධන ක්‍රියාදාමයන් පිළිබඳව අපට ද ආඩම්බර විය හැක.

එමෙන්ම නොබෝදා ජනතා අයිතියට පත්කල කොළඹ - දකුණ වරාය සංවර්ධන යෝජනා ක්‍රමය ආසියාවටම ආශ්චර්යයක් එක්කල ක්‍රියා දාමයකි. එයින් අප රටේ භූගෝලීය සිතියමේ හැඩය පවා වෙනස් වී ඇති අතර, ලෝකයේ නිෂ්පාදිත ඕනෑම විශාල නෞකාවකින් අප රටට සේවය ලබා ගැනීමටත්, ලෝකයේ ඕනෑම රටකට අපගේ වරාය හරහා සේවය ලබා දීමටත්, හැකියාව ලැබී ඇත. විවිධ බලාපොරොත්තු ඇති අය කෙලෙස විවේචනය කලත්, රටට ආදරය කරන අය මෙම සුවිශේෂී වූ ක්‍රියාදාමයන් අගය කළ යුතුය. රට රැක ගැනීමට කැපවූ ශ්‍රී ලාංකික පොදු ජනතාවගේ අභිවෘද්ධිය උදෙසා මෙවැනි වරායක් සකස් කර ජාතියට පවරා දීම පිළිබඳව අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාටත්, ගරු රෝහිත අබේගුණවර්ධන අමාත්‍යතුමාටත්, වරාය අධිකාරියේ සභාපතිතුමාටත්, මෙයට දායකත්වය දුන් සියළුම නිලධාරි හා සේවක මහත්ම මහත්මීන්ටත්, වෘත්තිය සමිති වලටත් මෙම කර්තව්‍ය දැක අගය කළ සියළු දෙනාටත් මෙම බස්නාහිර පළාතේ පලාත් සභාව සිය ස්තූතිය පළකරමින් ආශිර්වාදය පුද කර සිටියි."

(යෝ/V (01) / 13 / 06)

03. **ගරු නෙළුක් දර්ශන මල්ලව මන්ත්‍රීතුමා :**

"රාජ්‍ය සේවයට කාර්ය මණ්ඩල බඳවා ගැනීමේදී එම කාර්ය මණ්ඩලය තුල සිටින පහළම තනතුර දරන්නා වන්නේ කම්කරුවායි. එම කම්කරුවා මීට පෙර තනතුරු සඳහා ඇතුලත්වීමේදී අවම අධ්‍යාපන මට්ටමක් පැවතියද, එය රාජ්‍ය සේවයට ඇතුලත් වීමට ප්‍රමාණවත් විය. නමුත් මේ වන විට රජය තීරණය කර ඇති පරිදි කම්කරු තනතුරු ලබා ගැනීමේදී අ.පො.ස. (සා/පෙළ) පරීක්ෂණය විෂයන් 06 සමත් වී (ගණිතය ඇතුළුව) සම්මාන සාමාර්ථ 02 ක් තිබිය යුතුය. මෙ රටේ සාමාන්‍ය පෙළ අපේක්ෂකයින්ගෙන් 50% පමණ සෘජු ලෙසම බලපාන තීන්දුවකි. මන්දයත් සාමාන්‍ය පෙළ පරීක්ෂණයේදී ගණිතය විෂය අසමත් වන කණ්ඩායම 50% ආසන්නය. එයින් ගම්‍යවන එක් දෙයක් වන්නේ රටේ ශිෂ්‍ය ගහණයෙන් 50% කට රාජ්‍ය සේවයේ අවම රැකියාව හෝ ලබා ගැනීමට අවස්ථාවක් නොමැති වීමයි. මෙය තුළ නිර්මාණය වන සමාජ අර්බුදය අනාගතයේ මහත් ව්‍යසනයක් ඇති කරනු ඇත. එම නිසා බස්නාහිර පළාත් රාජ්‍ය සේවාව සඳහා කම්කරු ශ්‍රේණියට බඳවා ගැනීමේදී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා පෙනී සිටීම පමණක් සුදුසුකමක් සේ සලකා කටයුතු කරන ලෙස මෙම ගරු සභාව විසින් යෝජනා කර සිටියි."

(යෝ/V(01)13/10)

2013.10.22 දින පැවති සභා රැස්වීමෙ
වැඩ කටයුතු හා සම්බන්ධිතයි.

## XII. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ.සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව

2013.10.22 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහල, B පර්යන්තය,
යෙත්සිරිපාය,
බත්තරමුල්ල.